චක්‍රලේඛ අංක : 06/2012

මගේ අංකය : කේ01/2
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2012.02.03

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත,

## 64 වන නිදහස් දින සැමරුම වෙනුවෙන් පිරිනමන විශේෂ රාජ්‍ය සමාව - 2012.02.04

2012.02.04 වන දිනට යෙදෙන ජාතික නිදහස් දින සැමරුම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තියේ බලතල ප්‍රකාරව පහත දැක්වෙන පරිදි බන්ධනාගාර දඬුවම් නියම කර ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රදානය කර ඇත.

01. 2012.02.04 දිනට බන්ධනාගාර ගතවී සිටින අදාළ සියළුම සිරකරුවන්ට ගෙවන ලද (ගත කරන ලද) වසරකට හෝ ඉන් කොටසකට සතියක් බැගින් (දින 07 ක) සමාවක් ලබාදීම.
02. 2012.02.04 දිනට දඩමුදල් නොගෙවීම මත බන්ධනාගාර ගතකරන ලද අදාළ සිරකරුවන්ගේ ගෙවමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.
03. 2012.02.04 දිනට සිර දඬුවම් ගෙවමින් සිටින වයස අවුරුදු 70 ඉක්මවූ සිරකරුවන්ගේ ඉදිරියට ගෙවමින් පවතින දඬුවමේ ඉතිරි ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන අංක (i) සිට (xxvii) දක්වා වූ වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් ගෙවන සිරකරුවන්ට ඉහත සඳහන් අංක 01, 02, යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ.

පහත දැක්වෙන වැරදි අතුරින් ළමා අපචාර හා ඊට සම්බන්ධ වැරදි සඳහා සිර දඬුවම් ගෙවන සිරකරුවන්ට ඉහත අංක 03 යටතේ දක්වා ඇති විශේෂ සමාව හිමි නොවේ.

| | වරද | අණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|---|
| (i). | නීතිවිරෝධී රැස්වීම් | 140 සිට 142 සහ 146 |
| (ii). | මංකොල්ල | 380,382 සහ 383 |
| (iii). | ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම. | 431,432,440,441 ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| (iv). | රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114 - 123 |
| (v). | පැහැරගෙන යාම් | 354 - 360 |
| (vi). | අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාළ ප්‍රදර්ශනය | 286A |
| (vii). | ළමුන්ට හිංසා කිරීම | 308A |

(viii). ණය බැදුම්කරයකට හෝ දාස භාවයට පත්කිරීම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් වැඩ ගැනීම, වහල්කමට භාජනය කිරීම සහ යුද්ධයේ යෙදවීම සදහා ළමයින් බදවා ගැනීම 358 A

(ix). කූට්ටනය 360A

(x). ළමයින්ගෙන් අයතු ලෙස ලිංගික ප්‍රයෝජන ගැනීම 360B

(xi). පැනැත්තන් වෙළඳාම් කිරීම 360C

(xii). ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිට්ලි කිරීම 360E

(xiii). දූෂණය කිරීම 364

(xiv). ව්‍යාභිචාරය 364A

(xv). අස්වාභාවික (ලිංගික) වැරදි 365

(xvi). පුද්ගලන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා 365A

(xvii). බරපතල ලිංගික අයථා ක්‍රියා 365B

(xviii). අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වුවත්

(xix). 1966 අංක 18 දරණ පිඩාකාරි ආයුධ පනතේ වැරදි

(xx). ගිනි අවි සංඥා පනත යටතේ වැරදි

(xxi). 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි

(xxii). 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි

(xxiii). වස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත

(xxiv). හදිසි නිතිය යටතේ වැරදිකරුවන් වුවන්

(xxv). ආදායම් බදු නඩු වල මුදල් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් සිරදඬුවම් විදින්නවුන්

(xxvi). රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වුවන්

(xxvii). ඉහත අංක 01 සිට xxvi යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධහමුදා පනත, නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය

ඉහත සදහන් විශේෂ සමාව අදාළ වනුයේ 2012.02.04 වන දින වන විට බන්ධනාගාරගතව සිර දඬුවම් විදිමින් සිටින සිරකරුවන් කෙරෙහි පමණි. මුදා හැරීම ක්‍රියාත්මක කළ යුතු දිනය 2012.02.04 දින වේ.

එක් සිරකරුවෙකුට ඉහත සදහන් විශේෂ රාජ්‍ය සමාවන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව 2012.02.04 වන දින පෙ.ව.8.00 ට පෙර දුරකථන පණිවුඩයක් හෝ ෆැක්ස් පණිවුඩයක් මගින් දැනුම් දී නිදහස් කිරීමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කරන්න.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්